ශීර්ෂය - 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය**		
	මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් යාවත්කාලින කර නොතිබුණි.	මේ වන විට ආදායම් වියදම් ගිණුම්ගත කිරීම ප්‍රධාන වශයෙන් CIGAS වැඩසටහන හරහා සිදු කෙරෙන බැවින් කාර්යාලය තුළ වැය ලෙජරය සිහිවටන ලේඛන ලෙස පවත්වාගෙන යනු ලබන බව	මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝරමය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගත යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද ජනාධිපතිවරණය හා මහ මැතිවරණය වෙනුවෙන් අංක 20-01-01-07-1409-12 දරන මැතිවරණ වැය ශීර්ෂයෙන් ගෙවන ලද රු.939,089,226 ක ගෙවීම් සම්බන්ධයෙන් සහ මාණ්ඩලික නිලධාරීන් සඳහා එක් එක් මාසයන්හි ගෙවන ලද වාණිජ මුද්‍රණ දීමනාවේ සංයුතියට අදාළ විස්තර ද,	මැතිවරණ වැය ශීර්ෂයෙන් ගෙවන ලද රු. 939,089,226 මුදලට අදාළව වැටුප් සාරාංශ හා වවුචර්පත් ද ඒවාට පාදක වූ අංශ විසින් සැකසූ ලේඛන ද වැටුප් අංශයේ ගොනු කර ඇති බවත් දීමනා ගෙවීමට අදාළව සකස් කරන ලද ලේඛන හා වැයපත් වැටුප් අංශයේ පවත්වාගෙන යනු ලබන බව හා දීමනා සකස්	මැතිවරණ වැය ශීර්ෂයෙන් දරන ලද වියදම් වලට අදාළ ලිපි ලේඛන සහ විවිධ දීමනා ගෙවීමට අදාළ උපයෝගී කරගන්නා ලද ලේඛන ඊට අදාළ ගෙවීම් වවුචර් සමඟ අමුණා තැබීමට කටයුතු කළ යුතු අතර ආයතන සංග්‍රහයේ VIII

කැලි ගණන දීමනාවට අදාළ කල වැඩ විස්තර ද, ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.3 වගන්තිය ප්‍රකාරව සති අන්තයන් හි සහ රජයේ නිවාඩු දින වල වැඩ කිරීම සඳහා (1/20 දීමනා) ලබා ගත් අනුමැතිය හා කල වැඩ විස්තර සම්බන්ධයෙන් විගණනයට අවශ්‍ය සාධාරණ තහවුරු කිරීමක් ලබා ගැනීමට නොහැකි විය.	කිරීමට පාදක කරගත් පැමිණීමේ වාර්තා, වැඩ විස්තර පත්‍රිකා, දෛනික සටහන් ඇතුළු ලේඛන අදාල අංශයන්හි පවත්වාගෙන යනු ලබන බව	පරිච්ඡේදයේ 10.3 වගන්තිය ප්‍රකාරව සති අන්තයන් හි සහ රජයේ නිවාඩු දින වල වැඩ කිරීම සඳහා (1/20 දීමනා) පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
CAM/D/GP/ML/ 2023, 3.2 (අ)	1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 ජනවාරි මස සිට වාණිජ මුද්‍රණ දීමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ට ගෙවනු ලබන අතර එහිදි එක් මාසයක වාණිජ මුද්‍රණ ඇනවුමෙහි වටිනාකම ස්ථාවරව පවතින පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීම සිදු කරනු ලැබේ. වර්ෂ 23 කටත් වඩා පැරණි පාදක අගය වෙළඳපොළ තත්ත්වයන් සමඟ සංශෝධනය කළ යුතු ය.	4.4 (අ)
CAM/D/GP/ML/ 2023, 3.2 (ආ)	වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදි සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබු කොන්දේසි වන පිරිවැය ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දීම, මුද්‍රණ කටයුතු වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරිම සහ හඳුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරිම හෝ එයට විකල්පයක් ලෙස අත්තිකාරම් ගිණුමක් ඇති කිරිම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම සපුරා ගෙන නොමැතිව බැවින් එම කොන්දේසි කඩිනමින් සපුරාලිය යුතු බව.	4.4 (අ)

CAM/D/GP/ML/ 2023, 3.2 (ඇ)	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තුවේ කැලි ගණනට දීමනා ගෙවීම 2018 වර්ෂය සඳහා පමණක් අනුමත කර ඇති අතර ඉන් පසු 2023 වර්ෂය දක්වාම ආයතන අධ්‍යක්ෂගේ අනුමැතියකින් තොරව කැලි ගණනට දීමනා ගෙවා තිබුණු බැවින් අදාළ දීමනා සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු බව සහ ඉදිරියේ දී ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව දීමනා නොගෙවිය යුතු බව	4.4 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2010 වර්ෂයේ සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අයවිය යුතු හිඟ ආදායම් ශේෂය 2024 දෙසැම්බර් 31 දිනට රු.157,951,243 ක් විය. එම ශේෂයන්ගෙන් රුපියල් මිලියන එකට වැඩි අය විය යුතු ණය ඇති රාජ්‍ය හා පුද්ගලික ආයතන 21 ක් වන අතර අයවීමට ඇති ණය ශේෂය රු.82,451,524 ක් විය. එම ආයතන වලින් කිසිදු මුදලක් 2024 වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2010 වර්ෂයේ සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ හිඟ ආදායම් වලින් රු.4,219,226 මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 කි.	2010 – 2019 දක්වා හිඟ ණය ශේෂය 2025 මාර්තු 31 වන විට රු. 157,748,953 දක්වා අඩුකර ගෙන ඇති බව	හිඟ ශේෂ අයකර ගැනීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතු ය.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ගිණුම් අනුව 2009 වර්ෂයට පෙර සිට පැවත එන හිඟ ආදායම් ශේෂය රු.81,019,843ක් වූ අතර එම හිඟ ආදායම 2024 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මෙම හිඟ ශේෂයන්ට	2009 වර්ෂයේ හා ඊට පෙර වර්ෂ වල රු. 81,019,843 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට උත්සහ කළ ද කිසිදු මුදලක් අයකර ගැනීමට මේ වන තෙක් නොහැකි වී ඇති බවත් මෙම හිඟ ශේෂයන්ට	හිඟ ආදායම් ශේෂ අයකර ගැනීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතු ය.

	ඇතුළත් ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. ආයතනය වෙතින් ලැබිය යුතු හිඟ ආදායම වන රු.10,155,733ක මුදලට අදාළ ණය ශේෂ තහවුරු කිරීමේ දී එම ආයතනය විසින් ආයතනයේ ගිණුම් පොත් පත් අනුව එවැනි මුදලක් ගෙවීමට නොමැති බවත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ඉන්වොයිස් පත් 1989-2002 යන කාල සීමාවට අයත් ඒවා බවත් විගණනය වෙත දැනුම් දී තිබුණි.	ඇතුළත් ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. ආයතනයෙන් ලැබිය යුතු රු.10,155,733 ක මුදල සම්බන්ධ ලේඛන මෙම දෙපාර්තමේන්තුවේ සහ එම ආයතන තුල ද සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අයකර ගැනීමේ කටයුතු දුෂ්කර වී ඇති බව	
(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම වූ රු.559,928,948 න් සමාලෝචිත වර්ෂයේදී රු.96,143,723 ක් පමණක් අය කර ගෙන තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ ආදායම රු.463,785,225 ක් විය.	2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.559,928,948 ක් වූ අතර එම මුදල 2025 මාර්තු 31 දින වන විට රු. 310,983,536 ක් දක්වා අඩුකර ගැනීමට කටයුතු කර ඇති බව	හිඟ අදායම් ශේෂ අයකර ගැනීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතු ය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා අංක 211-01-01-2103 හා අංක 211-01-02-2103 දරන වැය විෂයන් යටතේ 2024 වර්ෂය සඳහා රු.351,000,000 ක මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් කරගෙන ඇති අතර 2024 දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදන වලින් සියයට 90ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. තව ද, 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූලධන වියදම් සඳහා වෙන් කර ඇති ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 59ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	2024 වර්ෂය අවසානයේ දී ඇණවුම් නියෝග (Purchase Order) නිකුත් කොට තිබූ අයිතමයන්හි වටිනාකම රු.23,277,178 ක් වූ බවත් 2024 වර්ෂයේ දී එම අයිතම දෙපාර්තමේන්තුව වෙත සැපයුම් කර නොමැති වීම හේතුවෙන් 2024 වර්ෂයේ 211-01-02-2103 වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව	ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි සැලසුම් කර කාලීනව අවශ්‍ය කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කළ යුතු ය.

(ආ)	අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 02.(ඇ) iii. අනුව වැය විෂය අංක 1003-වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් අවම වශයෙන් සියයට 6ක් ඉතිරි කළ යුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් සියයට 1 ක ප්‍රමාණයක් පමණක් ඉතුරු කර තිබුණි.	ප්‍රතිපාදන ඉතිරි වීම් අපේක්ෂා කළ හැකි වැය විෂයයන් හි ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමෙන් අවශ්‍ය ප්‍රතිපාදන සළසා ගන්නා ලෙසට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් කල දැනුම්දීම අනුව මු.රෙ.66 මඟින් රු.මි.140ක් තවදුරටත් අතිකාල වැය විෂයෙන් දීමනා වැය විෂය සඳහා මාරු කරන ලද බව	අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කළ යුතු ය.
(ඇ)	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා අංක 211-01-01-2401 හා අංක 211-01-02-2401 දරන වැය විෂයන් යටතේ රු.4,000,000 ක මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් කරවාගෙන ඇති අතර 2024 දෙසැම්බර් 31 දින මෙම ප්‍රතිපාදන වලින් රු.1,579,000 ක් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය වෙත ගෙවා තිබුණ ද එම පුහුණු පාඨමාලාවන් සඳහා සේවකයින් යොමු කර නොතිබුණි.	2024 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය වෙත රු.1,579,000 ක මුදලක් ගෙවා ඇති බවත් මෙම පුහුණු පාඨමාලා සඳහා නිලධරයන් යොමු කිරීම වාර්ෂික පුහුණු සැලැස්ම යටතේ විධිමත්ව සිදු කරනු ලබන බව	නිශ්චිත කාර්යයන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතු ය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පිළියෙල කර ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ විවිධ වැය විෂය සඳහා වූ බැරකම් දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ බැරකම් ලේඛනයෙහි ඇතුලත් නොකළ වටිනාකම රු.75,136,621 ක් විය.	2024 දෙසැම්බර් මාසයේ වැය ලෙජරයේ බැඳීම් ලෙස සටහන් කර තිබූ රු. 22,785,765ක වටිනාකමට අදාළ වවුචර්පත් ගෙවීම් සඳහා යොමු කර තිබුණ ද එම වවුචර්වල පැවති අඩුපාඩු හේතුවෙන් 2024 වර්ෂයේ ගෙවීම් කිරීමේ අපේක්ෂාවෙන් ඒවා නැවත අඩුපාඩු සකස් කිරීමට යොමු කළ බැවින් බැඳීම් ලෙස පෙන්වීමට අතපසු වී ඇති බව සහ වැය ලෙජරයේ බැඳීම් ලෙස සටහන් කර තිබූ රු. 49,709,736 ක මුදලකට අදාළ වවුචර්පත් අතපසු වීමකින් බැරකම් ප්‍රකාශයට ඇතුළත් වී නොමැති බවත් එම වරද ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව	අදාළ වටිනාකම නියමිත පරිදි බැරකම් ලේඛනයේ ඇතුළත් කිරීමට කඩිනමින් පියවර ගත යුතු ය.

3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව විසින් අගෝස්තු සහ සැප්තැම්බර් මාසයන්හි නිලධාරින් වෙත ලබා දුන් වාණිජ මුද්‍රණ දීමනාව ගණනය කිරීමේ දී මැතිවරණ රාජකාරි කටයුතු ද වාණිජ මුද්‍රණ දීමනා ගණනයට අදාළ කරගෙන තිබූ අතර එම මාසයන්හි වාණිජ මුද්‍රණ දීමනාව ලෙස රු. 4,448,121 ක් මැතිවරණ වැය ශීර්ෂයේ ප්‍රතිපාදන මඟින් ගෙවීම් කර තිබුණි. ඒ අනුව, මැතිවරණ කටයුතු සඳහා මැතිවරණ කොමිෂන් සභාව මඟින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව මැතිවරණ වැය විෂයට අදාළ නොවන දෙපාර්තමේන්තුවේ වාණිජ මුද්‍රණ දීමනා ගෙවීම් සඳහා භාවිතා කර තිබුණු අතර එම ගෙවීම් සිදු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මු.රෙ. 136,137,138,139,145, 146, 208 හා 449(i) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	වාණිජ මුද්‍රණ කටයුතු වල වටිනාකම ගණනය කිරීමේ දී අතපසුවීමකින් අගෝස්තු සහ සැප්තැම්බර් මාස වල වාණිජ මුද්‍රණ කටයුතුවලට අදාළ කර නොගන්නා වටිනාකම් ඇතුළත් වී ඇති බව සහ එම වටිනාකමට අදාළව ගෙවනු ලැබූ දීමනා සියලු නිලධාරින්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව සහ මැතිවරණ කාලසීමාවේ දී දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන බහුතර මුද්‍රණ කටයුතු මැතිවරණයට අදාළව සිදු කරන බැවින් ගෙවනු ලැබූ දීමනා සියල්ල මැතිවරණ විෂයට හර කර ඇති බව, ඉදිරියේ දී එවැනි අතපසුවීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව	අදාළ නෛතික විධිවිධාන යටතේ දීමනා ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ගෙවීම් සිදු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මු.රෙ.136,137, 138, 139,145,146,208 හා 449(i) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු ය.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ සඳහා ගෙවූ දීමනා මුදල රු.330,711,885 ක් බවට සහතික කර ඇති නමුත් විගණනයට අනාවරණය වූ තොරතුරු අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබාදුන් රු. 1,967,811,982 ක ප්‍රතිපාදන මඟින්, රු.939,089,266 ක මුදලක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. එය මැතිවරණ කොමිසම ලබාදුන් ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් වශයෙන් සියයට 50 කි.	ජනාධිපතිවරණය සහ මහමැතිවරණය සඳහා ලැබූ ප්‍රතිපාදන වලින් ආහාර පාන සහ සුබසාධන වියදම් සඳහා රු.35,997,700 ක් ද සේවක වැටුප් හා මැතිවරණයට සම්බන්ධ අනෙකුත් වියදම් රු.605,956,852 ක් ද ගෙවා ඇති බව	වෙනත් වැය ශීර්ෂයන්ගේ ප්‍රතිපාදන තුළින් දරන වියදම් පිළිබඳව විස්තර හා උපයෝගී ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන යා යුතු ය. ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය.
(ඇ)	2024 වර්ෂයේ මැතිවරණ කටයුතු සඳහා දීමනා ගෙවීමේදී ඡන්ද පත්‍රිකාව මුද්‍රණය කිරීම වෙනුවෙන් දිනකට පැය 12 ක කාලයක් පදනම් කරගෙන එනම් සම්පූර්ණ දිනයම සේවකයාගේ දායකත්වය මත ඡන්ද පත්‍රිකාව මුද්‍රණ කිරීම යන පදනම මත ඡන්ද පත්‍රිකා මුද්‍රණ දීමනාව ගෙවා තිබුණ ද, එම	පලාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 ට අදාළ මැතිවරණ මුද්‍රණ කටයුතු පොදුවේ මැතිවරණ මුද්‍රණ වශයෙන් සලකා මැතිවරණ දීමනාව පමණක් ගෙවීමට තීරණය කර, එපරිදි කටයුතු කර ඇති බව	අදාළ නෛතික විධිවිධාන ප්‍රකාරව දීමනා ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතු ය.

	කාලය තුළදී ම වාණිජ මුද්‍රණ කටයුතු ඉටුකිරීම වෙනුවෙන් මාණ්ඩලික නිලධාරීන් වෙත වාණිජ මුද්‍රණ දීමනාව ද, අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා මුද්‍රණ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් කැලි ගණන දීමනාවද ගෙවා තිබුණි. ඒ අනුව, පූර්ණ කාලීනව එකම කාලයක් තුළ සේවකයින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිය ඉටු කිරීම වෙනුවෙන් හිමි වැටුපද දිනකට පැය 12 ක දායකත්වයක් සහිත ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම වෙනුවෙන් මුද්‍රණ දීමනාව ද, එම කාලය තුළදී ම මාණ්ඩලික නිලධාරීන් විසින් වාණිජ මුද්‍රණ දීමනාව ද, අනෙකුත් නිලධාරීන්ට විසින් කැලි ගණන දීමනාව ද ලබාගෙන තිබුණි.		
(ඈ)	2024 වර්ෂයේ පැවැත් වූ ජනාධිපතිවරණය සඳහා දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු නමුත් 2024 මහ මැතිවරණය සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. එහි දී, ජනාධිපතිවරණයට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවෙහි අමු ද්‍රව්‍ය, ශ්‍රමය සහ පොදු කාර්යය යනුවෙන් පිරිවැය හඳුනාගෙන තිබුණි. කඩදාසි මිළදී ගැනීමට මෙන්ම වැටුප් හා වේතන සඳහා 2024 වර්ෂයේ අයවැයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සපයා ඇති බැවින්, දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත සාවද්‍ය පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 12 දිනැති අංක DGP/IWT/2024-Parliament-01 දරණ ලිපියට අනුව පාර්ලිමේන්තු මැතිවරණය සඳහා රු.1,031,480,586 ක් වියදම් කර තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	දෙපාර්තමේන්තුව වෙත මුද්‍රණ ඇණවුම් ලැබෙන සෑම අවස්ථාවක දී ම පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු වන අතර එමඟින් පිරිවැය පාලනය කරගැනීමට හැකියාව ලැබේ. සත්‍ය පිරිවැය නිවැරදිව හඳුනාගෙන අදාළ වැය විෂයන්හි ගිණුම් තැබීම සිදු කළ යුතු ය.
(ඉ)	ජනාධිපතිවරණය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් රු.929,559,739 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එමඟින් ආහාරපාන සඳහා රු.20,035,345 ක් ද සේවක දීමනා සඳහා රු. 352,804,060 ක් ද, අනෙකුත් මුද්‍රණ වියදම් ලෙස රු.556,720,334 ක්	ජනාධිපතිවරණය සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙතින් රු.933,473,160 ක මුදලක් ප්‍රතිපාදන ලෙස ලබා දී ඇති බව. එහි දී ආහාරපාන සහ සුබසාධන සඳහා රු.20,035,345 ක් ද දීමනා	සත්‍ය වශයෙන්ම අදාළ වන පිරිවැය මූලිකාංග ඇතුළත් කරමින් ඇස්තමේන්තු සකස් කළ යුතු අතර ඊට අනුකූලව වියදම් දැරීමටත් එම

	ද ගිණුම්ගත කර තිබුණු නමුත් සකස් කරන ලද ඇස්තමේන්තුවේ සඳහන් පරිදි අමුද්‍රව්‍ය හා පොදු කාර්යය වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම කොපමණද යන්න හඳුනාගෙන මැතිවරණ වැය විෂය තුළ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	සහ අනෙකුත් වියදම් සඳහා රු. 352,804,060 ක් ද, මුද්‍රණ ආදායම් රු.60,633,755 ක් ලෙස මුළු ප්‍රතිපාදන උපයෝජනය කර ඇති බව	ගණුදෙනු අදාළ වැය විෂයන්හි නිසි පරිදි ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතු ය.
(ඊ)	ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු වලට අදාළව දෙපාර්තමේන්තුව විසින් CIGAS පද්ධතියට ඇතුළත් කර ඇති අංක 020-1-1-7-1409 යන වැය ලෙජරයේ මුළු වියදම ලෙස රු.2,303,861,774ක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඉන් රු.1,077,125,609 ක් සේවක දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.	මැතිවරණ දෙකම සඳහා සේවක දීමනා වෙනුවෙන් වියදම් වූ මුදල රු. 605,944,358 ක් බව	අදාළ නෛතික විධිවිධාන ප්‍රකාරව දීමනා ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතු ය
(උ)	කළමනාකරණ ගිණුම්කරණ සංකල්පය අනුව ඇස්තමේන්තුගත පිරිවැය සහ සත්‍ය පිරිවැය සංසන්දනය කිරීම සඳහා විචලතා විශ්ලේෂණ වාර්තා සකස් කර ඒ අනුව පිරිවැය පාලනය කල යුතු වුවද, අයවැය ප්‍රතිපාදන වලින් පවත්වාගෙන යන දෙපාර්තමේන්තුව මැතිවරණ මුද්‍රණ කටයුතු වලට අදාළව එම කිසිදු පිරිවැය පාලනයක් සිදු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	කළමනාකරණ පිරිවැය ගිණුම්කරණ සංකල්ප අනුව ඇස්තමේන්තුගත පිරිවැය සහ සත්‍ය පිරිවැය සංසන්දනය කිරීම සඳහා විචලතා විශ්ලේෂණ වාර්තා සකස් කර පිරිවැය පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු ය.
(ඌ)	2024 වර්ෂයේ දී පැවැත්වූ මැතිවරණ කටයුතු සඳහා ගෙවූ දීමනා පිළිබඳ නියැදි පරීක්ෂාවේදී විධායක ශ්‍රේණියේ නිලධාරීන් 5 දෙනෙකු විසින් රු.2,302,300, රු.1,860,263, රු.2,179,748 ,රු.1,460,548 සහ රු.2,421,563 ක මුදලක් මැතිවරණ දීමනා වශයෙන් ලබාගෙන තිබුණු අතර එම දීමනා ගෙවීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	මැතිවරණ මුද්‍රණ කටයුතු සිදු කරන කාල සීමාව තුළ දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන් ඔවුන්ගේ නිත්‍ය රාජකාරීවලට අමතරව ඡන්ද පත්‍රිකා මුද්‍රණ කටයුතු අධීක්ෂණය හා ඊට අදාල සහායක සේවා සැපයීමෙන් අධීක්ෂණ රාජකාරි වල යොදවන ලද බව	දීමනා ගෙවීමේදී විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ඔවුන් විසින් නිශ්චිතව ඉටුකළ කර්යසාධනය හදුනාගෙන ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රු.162,974,754 ක වටිනාකමක් සහිත Four Colour Vertical Web Offset Printing Machine යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා 2024 දෙසැම්බර් 30 දින ණයවර ලිපි විවෘත කර ඇති අතර එහි වටිනාකම රු.350,000,000 ක් ලෙස අධි තක්සේරුවක් සහිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. එම යන්ත්‍රය මිල දී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු 2024 වර්ෂයේ ජනවාරි මස සිට ආරම්භ කර තිබුණ ද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නිසි කාල රාමුවක් සකස් කර නොතිබීම හේතුවෙන් 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන තුලින් එම යන්ත්‍රය මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි.	Four Colour Vertical Web Offset Printing යන්ත්‍රය යුරෝපීය රටකින් ආනයනය කිරීමට අදහස් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. මිලියන 350ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ බව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් ප්‍රසම්පාදන කටයුතු නැවත ආරම්භ කරන ලද අතර එහි තීරණය අනුව අදාළ මුද්‍රණ යන්ත්‍රය රු. 162,974,754.00 ක මුදලකට ඉන්දියාවෙන් ආනයනය කිරීමට කටයුතු යොදන ලද බව සහ පෙර ඇස්තමේන්තුවට වඩා අඩු මුදලකට Four Colour Vertical Web Offset Printing යන්ත්‍රය මිළ දී ගැනීමට සිදු වූ බව	ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි සැලසුම් කර කාලීනව අවශ්‍ය කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කළ යුතු ය.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව මැතිවරණ මුද්‍රණ කටයුතු සඳහා ආහාර පාන ලබා ගැනීමට දෙපාර්තමේන්තුවේ සුබසාධක අංශය මඟින් පවත්වාගෙන යන ආපනශාලාවෙන් පමණක් මිල ගණන් කැඳවා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලංසු පිරිනැමීමට ප්‍රසම්පාදන කමිටුව විසින් කටයුතු කර තිබුණි. එහි දී මැතිවරණ වැය විශයෙන් ආපනශාලාව වෙත රු.35,361,930 ක මුදලක් ආහාර පාන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණු අතර තරඟකාරී ලංසු කැඳවීමකින් අවම මිල ගණන් යටතේ ආහාරපාන ලබා ගැනීමට තිබූ අවස්ථාව පැහැර හැර තිබුණි.	2024.09.12 හා 2024.10.18 දිනැති ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව කටයුතු කර ඇති බව සහ මැතිවරණ මුද්‍රණ කටයුතු සඳහා ආහාර පාන සැපයීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව මඟින් මැතිවරණ වැය විෂයය යටතේ භෝජනාගාර සුබසාධක අංශය වෙත ගෙවීම් කර ඇති බව	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු ය.

(ඇ)	2024 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 221,732,549 ක වටිනාකමින් යුත් ඇණවුම් 04 කට අදාළ කඩදාසි මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කිරීමේ දී එම කඩදාසි අවපැහැගැන්වී තිබීම, එකිනෙකට ඇලීම, රැලි වැටීම සහ යන්ත්‍ර තුලින් ගමන් කිරීමට අපහසු වීම යන දෝෂ අනාවරණය වීමෙන් පසුව දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට නැවත තාක්ෂණික කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුව විසින් අදාළ කඩදාසි ප්‍රමිතීන්ට අනුකූල නොවන බවත් කාර්මික තාක්ෂණික ආයතනය වැනි සුදුසුකම් ලත් ආයතනයකින් එහි අනුකූලතාවය තහවුරු කරගැනීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට සුදුසු බවටත් නිර්දේශ කර තිබුණි. නමුත්, එසේ තහවුරු කිරීමක් ලබා ගැනීමකින් තොරව ගණකාධිකාරී විසින් ගෙවීම අත්හිටුවා ඇති අවස්ථාවක දී මුද්‍රණාලයාධිපතිගේ නිර්දේශ සහ අනුමැතිය මත ප්‍රමිතියෙන් තොර එම කඩදාසි සඳහා අදාළ ගෙවීම් සිදු කර තිබුණි.	රජයේ මුද්‍රණාලයාධිපති විසින් එම මුද්‍රණ කඩදාසි පිරිවිතර සමඟ සැසඳෙන බවට ලිඛිත සටහන් යොදා සහතික කර ඇති බවත් ඒ අනුව මුද්‍රණාලයාධිපතිගේ නියෝග අනුව ගෙවීම් සිදු කර ඇති බව	දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා හඳුනාගත් නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කර රජයට සිදු වූ අලාභය අයකරගැනීමට කටයුතු කළයුතුය .

4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ අංක 42 - 8502 සහ 56 - 9718 යන වාහන දෙකක් සඳහා 2019 වර්ෂයේ සිට මේ දක්වා ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති අතර මෙම වාහන 2024 දෙසැම්බර් 31 දින වනවිටත් අක්‍රීව පැවතුණි. එහි දී, එම වාහන නැවත භාවිතය සඳහා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු මේ වන විට ධාවනයෙන් ඉවත් කර ඇති අංක 42-8502 දරන ලොරි රථය සහ අංක 56-9718 දරන කැබ් රථය අපහරණය කිරීමට තීරණය කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම පිණිස අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති(පාලන) සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇති බව එම කමිටු නිර්දේශ අනුව අපහරණය කිරීමට නියමිතව පවතින බව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අපහරණ කටයුතු සිදු කළ යුතුය.

4.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවට අයත් GB-4097 දරණ කැබ් රථය ජලයෙන් යටවූ මාර්ගයක ධාවනය කිරීම හේතුවෙන් එම රථයට හානි සිදු වී ඇති අතර එය අලුත්වැඩියා කිරීම සඳහා රු.498,500 ක මුදලක් වැය කර තිබුණි. එම හානිය සම්බන්ධයෙන් මු.රෙ. 104 අනුව කටයුතු කර නොමැති බවත් මු.රෙ.110 අනුව හානි පිළිබඳ ලේඛනයන්හි එම විස්තර ඇතුළත් කර නොමැති බවත් විගණනයට නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුවට අයත් GB-4097 දරන කැබ් රථයට හානි සිදු වීම සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලයක් පත් කර පරීක්ෂණයක් කිරීමට කටයුතු යොදා ඇති බව එම නිර්දේශ අනුව හානි පාඩු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බව	මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය.

4.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1998 ජනවාරි දින රහිත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නියෝග කර ඇති කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව වාණිජ මුද්‍රණ දීමනාව ලබා ගැනීමට හැකියාව ඇති නමුත් දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා එම කොන්දේසි ක්‍රියාත්මක කිරීමකින් තොරව අඛණ්ඩව දීමනා ලබා ගෙන තිබුණි. එසේම, එහි නියෝග පරිදි දීමනා ගණනය කිරීම සඳහා පාදක මුදල රුපියල් මිලියන 40 ලෙස දක්වා ඇති නමුත් එම පාදක මුදල 1998 වර්ෂයේ තීරණය කර තිබූ මුදලක් වූ අතර 2024 වර්ෂයට අදාළ වන පරිදි වෙනස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී කිසිදු අනුමැතියකින් තොරව රු.827,304,484 ක මුදලක් කැලිගණනට දීමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර සමස්ත දීමනා ලෙස රු.1,371,937,848 ක් ගෙවා තිබුණි. එය විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සිය මූලික වැටුප මෙන් 49 ගුණයක උපරිමයක් දක්වා ද, අනෙකුත්	මැතිවරණ මුද්‍රණ කටයුතු සිදු කරන කාල සීමාව තුල සාමාන්‍ය දෛනික රාජකාරි වලට අමතරව අඛණ්ඩව මැතිවරණ මුද්‍රණ කටයුතු අවසන්ව වන තෙක් විධායක නිලධාරීන් මෙන්ම අනෙකුත් සියලු නිළධාරීන් මැතිවරණ මුද්‍රණ කටයුතු වලට අතිරේකව අනෙකුත් සාමාන්‍ය රාජකාරි කටයුතු වල ද යොදවනු ලබන බව 2024 වර්ෂයට පෙර පැවති මැතිවරණ වලදී විධායක නිලධාරීන් සහ මාණ්ඩලික නිලධාරීන් සඳහා මැතිවරණ ආදායම වාණිජ මුද්‍රණ දීමනාවක් ලෙස රු.මිලියන 40 කොටස් වශයෙන් වාණිජ මුද්‍රණ සමීකරණයට ඇතුළත් කර ගෙවා ඇති බව 2024 පැවති මැතිවරණ වලදී විධායක සහ මාණ්ඩලික නිලධාරීන් සඳහා ද අනෙකුත් නිලධාරීන්ට ගෙවීම් කළ ක්‍රමවේදයම අනුගමනය කරමින් දීමනා ගෙවීම සිදු කර ඇති බව	පොදු අනුමත දීමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කළ යුතු ය.

	සියළුම සේවකයින් සඳහා සිය මූලික වැටුප මෙන් 67 ගුණයක උපරිමයක් දක්වා ද ගෙවා තිබුණි.		
(ආ)	දෙපාර්තමේන්තුවේ මුද්‍රණ කටයුතු සඳහා යොදා ගන්නා මුද්‍රණ කඩදාසි විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගබඩා කර ඇති අතර ගබඩා අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විවිධ ප්‍රමාණයේ සහ විවිධ GSM අගයන්ගෙන් යුත් රීල් 94,669 ක් සහ ෂීට් 3193 ක් පැවතුන ද මු.රෙ.756 ප්‍රකාරව මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කඩදාසි ගබඩාවේ ඇති බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	තොග සත්‍යාපනය කිරීමෙන් අනතුරුව ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව හා වාර්ෂිකව තොග සමීක්ෂණය සඳහා ද ඉදිරි කටයුතු යොදනු ලබන බව	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය.
(ඇ)	මු.රෙ.763 ප්‍රකාරව විශාල ප්‍රමාණ වශයෙන් භාණ්ඩ තබා ගන්නා දෙපාර්තමේන්තු විසින් ද භාණ්ඩ නිෂ්පාදනයෙහි හෝ අලුත්වැඩියාවෙහි හෝ නියුක්තව ඇති දෙපාර්තමේන්තු විසින් ද නිලධාරීන්ට මඟ පෙන්නුම් පිණිස ප්‍රමාණවත් පරිදි ව්‍යවස්ථා සම්පාදනය කළ යුතු බව දක්වා ඇති නමුත් මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ ගබඩා ව්‍යවස්ථා සම්පාදනය කර නොතිබුණි.	මු.රෙ.763 ප්‍රකාරව ගබඩා ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීම සඳහා ද කටයුතු කරනු ලබන බව	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය.
(ඈ)	සේවා අංක 6590 සහ 6612 දරන නියාමකවරුන්හට, දෛනික නිෂ්පාදනයෙන් සියයට 9 ක ප්‍රතිශතයක් කැලි ගණනට අනුව දීමනා ලැබීමට මුද්‍රණාලයාධිපතිනියගේ සහ දෙපාර්තමේන්තුවේ වැටුප් කමිටුවේ අනුමැතිය ලැබී ඇති නමුත් මෙම ප්‍රතිශතයන් ඉක්මවා ගොස් පොත් බැඳීම් අංශයේ නියාමක හට රු.1,112,814 ක් ද හරි වැරදි බැලීම් අංශයේ නියාමක හට රු.1,035,097 ක් ද දීමනා ලෙස ගෙවා තිබුණි. එහි දී, මෙම ඉක්මවූ ගෙවීම ප්‍රතිශතයක් ලෙස ගත් කල එක් එක් මාසය සඳහා සියයට 9 සිට සියයට 42 දක්වා වූ විවිධ පරාසයන් තුළ ගෙවීම් සිදු කර තිබුණි.	රහස් පොත් බැඳීම් හා රහස් හරි වැරදි බැලීම් යන අංශයන් එක් අංශයක් ලෙස පැවත පසු කාලීනව එය අංශ 02ක් ලෙස සලකා වැඩ මූලික නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇති බවත් රහස් අංශයේ පවතින රාජකාරී සැළකිල්ලට ගෙන අවස්ථානුකූලව අංශ දෙකෙහිම අධීක්ෂණ කටයුතු වැඩ මූලික දෙදෙනාම විසින් සිදු කර ඇති බවත් ඒ අනුව ඒ සඳහා ගෙවීම් කිරීමේ දී පළමුවර අංශ දෙකේ එකතුවෙන් සියයට 5 ක් ප්‍රතිශතයක් ද , ඉන් පසුව පත්කරනලද දෙපාර්තමේන්තු කමිටු නිර්දේශය මත එම ගෙවීම සියයට 9 දක්වා වැඩිකර තිබුණි. එය නැවත 2023 දෙසැම්බර් 01 දින සිට පත්කළ කමිටු තීරණයක් මත අංශ දෙක අතර සියයට 9 බැගින් වෙන වෙන වෙනම දීමනා ගණනය කර ගෙවන ලදී .	පොදු ක්‍රමවේදයක් අනුමත කරගැනීමෙන් අනතුරුව දීමනා ගෙවීමට කටයුතු කළ යුතු ය.

(ඉ)	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අලෙවි කිරීම සඳහා 2023 වර්ෂයේදී මුද්‍රණය කළ අභ්‍යාස පොත් ප්‍රමාණයෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් රු.13,789,306 ක් වටිනා පොත් 124,568 ක් ඉතිරි වී තිබුණි.	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අලෙවි කිරීම සඳහා මුද්‍රණය කරන ලද අභ්‍යාස පොත් ඉලක්කගත පරිදි අලෙවි නොවීමේ හේතුව මත 2024 දෙසැම්බර් 31 දින වන විට පොත් 124,568ක ප්‍රමාණයක් ඉතිරි වී ඇති බවත් එම ප්‍රමාණය ඉදිරියේදී ප්‍රකාශන පියස මඟින් අලෙවි කිරීමට සැලසුම් කර ඇති බව	පොත් අබලි බවට පත්වීම වළක්වා ගනිමින් එම පොත් අලෙවි කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඊ)	2024 දෙසැම්බර් 31 දින වන විට අත්තිකාරම් "බී" ගිණුමේ වසර 05කට වැඩි රු.2,630,475 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂය වන රු.2,630,475 ක් වූ මුදලින් රු.2,599,945 ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව	පැරණි හිඟ ශේෂ අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(උ)	රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 01/2024 හා 2024 ජනවාරි 10 දිනැති අයවැය චක්‍රලේඛයෙහි 8.2 වන වගන්තිය අනුව නිසි අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහිත හා ඇස්තමේන්තු තුළ ඇතුළත් කර වැය විෂය අංක 1501, 1504 හා 2022 යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති සුබසාධන/සහනාධාර හෝ සංවර්ධන සහාය වැඩසටහන් හැර අනෙකුත් වැය විෂයන් යටතේ වන ප්‍රතිපාදන භාවිතා කරමින් ආයතන මට්ටමින් තීරණ ගෙන සහනාධාර වැඩසටහන් හෝ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක නොකළ යුතු ය යන්න දක්වා ඇත. එසේ වුව ද, අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව හුදෙක් සුබසාධන කාර්යයක් ලෙස 2019 වර්ෂයේ සිට මේ දක්වා සියලුම කාර්ය මණ්ඩලය වෙත විවිධ ප්‍රමාණයන්ගෙන් දියර කිරි ලබා දීමට කටයුතු කර තිබුණු අතර ඒ සඳහා 2024 වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් මස දක්වා 1409 (වෙනත්) යන වැය විෂයෙන් රු. 16,915,207 ක මුදලක් වියදම් කර තිබුණි.	2019 ජනවාරි මස පැවති හතර පුද්ගල කමිටුවකින් ලබා දුන් නිර්දේශ මත ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය වෙත දියර කිරි ලබා දීම සිදු කර ඇති බව සහ ලබා දිය යුතු ප්‍රමාණය තීරණය කිරීම සඳහා සේවකයන් විෂ රසායන ද්‍රව්‍ය සඳහා නිරාවරණය වන ප්‍රමාණය පදනම් කරගෙන ඇති බව.	සුබසාධන/ හනාධාර කාර්යයන් දහා දාළ චක්‍රලේඛ කාරව වැය විෂයන් වන් කර ගැනීමට ටයුතු කළ යුතු තර වෛද්‍ය ිර්දේශ සලකා ැලිය යුතුය .
(ඌ)	ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ II වන පරිච්ඡේදයෙහි 1:3 වගන්තිය ප්‍රකාරව නව තනතුරක් ඇති කරන කල්හි කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු	දෙපාර්තමේන්තුවේ ආපනශාලාව බාහිර පාර්ශවයක් වෙත බඳු පදනම මත ලබා දීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව සහ ඒ අනුව ආපනශාලාව වෙත අනුයුක්ත	ඔවුන් සේවයට බඳවාගත් තනතුරේ රාජකාරි ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය .

නමුත් දෙපාර්තමේන්තුවේ සුබසාධක අංශය විසින් පවත්වාගෙන යන ආපනශාලාව සඳහා එවැනි අනුමත සේවක සංඛ්‍යාවක් නොමැත. මුද්‍රණාලයාධිපතිගේ අනුමැතිය මත දෙපාර්තමේන්තුවේ ආපනශාලාව සඳහා විවිධ තනතුරු 14 ක් සකස් කර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල නිත්‍ය රාජකාරි වල නියුතු මුද්‍රණ සේවකයින් 21දෙනෙකු අනුයුක්ත කර තිබුණි. මෙම සේවකයින් නිත්‍ය රාජකාරිවල නිරත නොවුන ද 2024 වර්ෂය තුළ තම මූලික වැටුප මෙන් 67 ගුණයක උපරිමයක් දක්වා සියලු දීමනා ලබා ගෙන තිබුණි.

කර ඇති කාර්ය මණ්ඩලය නැවත නිත්‍ය රාජකාරි ස්ථාන වලට යොදවන බව.